# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 330 /2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 24/02/2024 පැය 0545

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් - වාලච්චේන පොලිස් වසම.**

2024.02.23 වන දින රාත්‍රී කාලයේදී වාලච්චේන පොලිස් වසමේ කුලාවඩිච්චේන ප්‍රදේශයේදී කාන්තාවකට කැත්තකින් පහරදීම හේතුවෙන් මියගොස් ඇති බවට වාලච්චේන පොලීසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 48 ක් වූ කුලාවඩිච්චේන, වාකනේරි ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පුද්ගලික ආරවුලක් හේතුවෙන් මරණකාරියගේ දියණියගේ පුරුෂයා විසින් මෙම පහරදීම සිදුකර ඇති බවට අනාවරණය වී ඇති අතර, පහරදීමෙන් පසු සැකකරු ප්‍රදේශයෙන් පලාගොස් ඇත. සැකකරු 2014.02.10 වන දින මරණකාරියගේ පුරුෂයා හට පොල්ලකින් පහරදී ඝාතනයට අදාලව සිරගතව සිට ඇපමත නිදහස්ව සිටින අවස්ථාවේදී මෙම අපරාධය සිදුකර ඇති බවට අනාවරණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් පරීක්ෂණයක් හා පශ්චාත් මරණ පරීක්ෂණය සිදු කිරීමට නියමිත ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. කාන්තාවක් පිලිස්සී මියයාමක් - ආරච්චිකට්ටුව පොලිස් වසම.**

2024.02.23 වන දින රාත්‍රී කාලයේදී ආරච්චිකට්ටුව පොලිස් වසමේ කිරිවල්කැලේ නිවසක් තුල සිටි කාන්තාවක් පිලිස්සී මියගොස් ඇති බවට ආරච්චිකට්ටුව පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 65ක් වූ කිරිවල්කැලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකාරිය තම ස්වාමි පුරුෂයා සමඟ පොල්අතු වලින් සෑදූ නිවසක් තුල ජීවත්ව සිට ඇති අතර නිවසට ගිනි ගැනීමට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත මෘත ශරීරය පොලිස් ආරක්ෂාව යටතේ එම ස්ථානයේ ඇති අතර 2024.02.24 වන දින මහෙස්ත්‍රාත්

පරීක්ෂණය සිදු කිරීමට නියමිතය ආරච්චිකට්ටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. විදුලිසැර වැදී පුද්ගලයෙකු මියයාමක් - රත්තොට පොලිස් වසම.

2024.02.23 වන දින උදෑසන කාලයේදී රත්තොට පොලිස් වසමේ පාරවල් 07 ප්‍රදේශයේ පුද්ගලික ඉඩමක ගවයින් බැදීමට ගිය පුද්ගලයෙකු හා ගවයෙකු විදුලිසැර වැදී මියගොස් ඇති බවට රත්තොට පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 62 ක් වූ රත්තොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. රත්තොට පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. දියේ ගිලී පුද්ගලයෙකු මියයාමක් - කිතුල්ගල පොලිස් වසම.

2024.02.23 වන දින සවස් කාලයේදී කිතුල්ගල පොලිස් වසමේ ලියන් ඔයේ දියනෑමට ගිය පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට කිතුල්ගල පොලීසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 70ක් වූ වවුළුගල, මග්ගෝන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තවත් පිරිසක් සමඟ ශ්‍රී පාදස්ථානය වන්දනාකර නැවත නිවසට යමින් සිටියදී ලියන් ඔයේ දිය නෑමට යාමේදී දියේ ගිලී මියගොස් ඇති අතර මෘත ශරීරය තැලිගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කිතුල්ගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. සැකකටයුතු මරණයක් - මහවෙල පොලිස් වසම.

2024.02.23 වන දින දහවල් කාලයේදී මහවෙල පොලිස් වසමේ පුංචිලේවකන්ද ප්‍රදේශයේ නිවසක් තුල පුද්ගලයේකු මියගොස් ඇති බවට රත්තොට පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 71 ක් වූ පුංචිලේවකන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු නිවසේ තනිව ජීවත්ව සිට ඇති අතර ඉඩමේ පුවක් කැඩීමට පැමිණි පුද්ගලයින් දෙදෙනෙකු විසින් මෙම පුද්ගලයා නිවසේ ඇදක් මත වැතිරී සිටින බව දැක ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වරයාට දැනුම් දීමෙන් පසු ඔහු විසින් පොලිස් ස්ථානය දැනුවත් කර ඇත. මරණයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.

2024.02.23 වන දින දහවල් කාලයේ මට්ටක්කුලිය පොලිස් වසමේ සුමිත්පුර ප්‍රදේශයේදී මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 200 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මට්ටක්කුලිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කළුතර උතුර පොලිස් ස්ථානය.**

2024.02.23 වන දින සවස් කාලයේ කළුතර උතුර පොලිස් වසමේ කරදංගොඩ ප්‍රදේශයේදී කළුතර උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදාගන්නා ගෝඩා ලීටර් 180 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වූ දෙල්දූව, වාද්දූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - අක්කරපත්තුව පොලිස් ස්ථානය.**

2024.02.23 වන දින උදෑසන කාලයේදී අක්කරපත්තුව පොලිස් වසමේ අලිගම්බේ ප්‍රදේශයේදී අක්කරපත්තුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සිදුකරන ලද වැටලීමකදී මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන සොරිකල්මුණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අක්කරපත්තුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**09. මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොටවෙහෙර පොලිස් ස්ථානය.**

2024.02.23 වන දින සවස් කාලයේදී කොටවෙහෙර පොලිස් වසමේ වදුරැස්ස ප්‍රදේශයේදී කොටවෙහෙර පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරකට අනුව සිදුකරන ලද වැටලීමකදී මෙරට නිෂ්පාදිත ගිනි අවි 02ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන වදුරැස්ස, මහගිරිල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොටවෙහෙර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10. මාරක රිය අනතුරක් - ගලෙන්බිදුණුවැව පොලිස් වසම.**

2024.02.23 වන දින දහවල් කාලයේ ගලෙන්බිදුණුවැව පොලිස් වසමේ ගැටලාව ගලෙන්බිදුණුවැව මාර්ගයේදී ගම්පොල කොටස ප්‍රදේශයේදී ගැටලාව දෙස සිට ගලෙන්බිදුණුවැව දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගත නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින්

බරපතල තුවාල ලැබූ යතුරුපැදියේ පැදිකරු හා පසු පැදිකරු ගලෙන්බිදුණුවැව රෝහලට ඇතුලත් කිරීමේදී පසුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 19 ක් වූ දකුණු ඉවුර, රාජාංගනය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගලෙන්බිදුණුවැව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට ඇතුලත් කර ඇත. ගලෙන්බිදුණුවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - යාපනය පොලිස් වසම.

2024.02.23 වන දින උදෑසන කාලයේ යාපනය පොලිස් වසමේ යාපනය පේදුරුතුඩුව මාර්ගයේ නල්ලූර් ප්‍රදේශයේදී පේදුරුතුඩුව දෙස සිට යාපනය දෙසට ධාවනය වූ බස් රථයක පාපුවරුවේ ගමන් කල මගියෙකු බස් රථයෙන් බැසීමට උත්සහ කිරීමේදී බස් රථයෙන් බිමට වැටී එම බස් රථයේ පිටුපස රෝදයට යටවී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ මගියා යාපනය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 31 ක් වූ නල්ලූර් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**